# WARNALEGAL
*Justice for all*

www.warnalegal.com




- FAMILY LAW
- MIGRATION LAW
- CONVEYANCING
- LITIGATION
- AUSTRALIAN LEGAL ADVICE
- SRI LANKAN LEGAL ADVICE
- COMMERCIAL & BUSINESS LAW
- POWERS OF ATTORNEY & WILLS
- ENGLISH/SINHALESE TRANSLATION & INTERPRETING SERVICE
- SRI LANKAN DEEDS & COMPANY REGISTRATION SERVICE

GUSS DESIGN 03 9769 0099



**Madhu Warnakulasuriya** *LL.B*
*Solicitor and Barrister*
*Registered Migration Agent*
*(MARN 1068979)*
*Attorney at Law in Sri Lanka*



Need Legal Help? Call us Now
**03 9792 9977**

Australia:
1/44 King Street
Dandenong VIC 3175
0432 480 133
+61 3 9792 9977
+61 3 9701 3718
info@warnalegal.com
warnalegal1

Sri Lanka:
01 Angampitiya Waikkala Sri Lanka
Hotline – 0776 120 008
031 22 72223 031 22 72223
warnalegal2@gmail.com
warnalegal2





## නිහඬතාවේ හඬ

සති දෙකක් නිහඬව භාවනා කිරීමට හාමුදුරුවරු හතරදෙනෙක් කතිකා කරගත්තා. භාවනාව ආරම්භ කල පළමු දවසේ රෑ මැදියමේ කාමරයට ආලෝකය දුන්න ඉටිපන්දම නිවිලා ගියා.

"අයියෝ.. ඉටිපන්දම නිවුණානෙ" එක් මහණෙක් කිව්වා.

"අපි කතා නොකර ඉන්න නේද පොරොන්දුවෙලා හිටියෙ?" දෙවෙනි මහණා ඇසුවා.

"උඹල දෙන්නම නිහඬතාව කැඩුවා" තුන්වෙනිය කිව්වා.

හතරවෙනියා මහ හඬින් සිනාසුණා.

"මං විතරයි කතා නොකර හිටියෙ" ඔහු ආඩම්බරෙන් කිව්වා..

**කොතැන සිටියද කෙලෙස මවා පෙන්නුවද ජන්ම ගති සැමවිටම ඉස්මතුව ඒම සත්තය**

## දෙවියන් ඕනෑවීම

ගඟක් අද්දර හුදකලාවේ භාවනා කරමින් හිටිය ආචාර්යවරයකු ළඟට තරුණයෙක් ආවා.

"ආචාර්යතුමනි.. මට ඔබේ ගෝලයකු වීමට අවශ්‍යයි" ආචාර්යවරයගේ භාවනාව බිඳ දමමින් තරුණයා කිව්වා.

"ඒ මොකටද?" ආචාර්යවරයා ඇසුවා.

තරුණයා ටිකවේලාවක් කල්පනා කළා.

"මට දෙවියන් සොයාගන්න අවශ්‍යයි" ඔහු කල්පනාව අවසානයේ කිව්වා.



ආචාර්යවරයා එකවරම ඉදිරිට පැන තරුණයාගේ බෙල්ලෙන් අල්ලාගත්තා. ගඟ ළඟට ඇදගෙන ගියා. තරුණයාට වචනයක්වත් කතා කරන්නට අවස්ථාව නොදී ඔහුගේ හිස වතුරේ එබුවා. තරුණයා හුස්ම ගන්නට නොහැකිව දඟලන්න පටන් ගත්තා. සෑහෙන වේලාවකට පස්සේ ආචාර්යවරයා තරුණයාගේ හිස වතුරෙන් උඩට ගත්තා.

තරුණයා අපහසුවෙන් හුස්ම ගන්නටත් කහින්නටත් වුණා. ඔහු ප්‍රකෘති තත්වයට එනතෙක් ආචාර්යවරයා බලා සිටියා. ඉන්පස්සෙ මෙහෙම ඇහුවා.

"දැන් මට කියපන් උඹේ හිස වතුරේ ගිලිලා තිබෙද්දි උඹට වැඩියෙන්ම අවශ්‍ය වුණේ මොකක්ද කියල"

"වාතය" තරුණයා එකවරම කිව්වා.

"බොහොම හොඳයි" ආචාර්යවරයා කිව්වා. "දැන් ගෙදර පලයන්.. ගිහින් දැන් උඹට වාතය අවශ්‍ය වෙච්ච තරමටම දෙවියන් අවශ්‍ය වුණාම ඇවිත් මාව හමුවෙයන්"

**දෙවියන් සහ ආගම පිළිබඳ කාරණා සැහැල්ලුවට නොගත යුතුයි**

ජගත්